# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2241/25 - 2021 අගෝස්තු මස 17 වැනි අඟහරුවාදා - 2021.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියට අනුව මා විසින් 2020.10.15 දින අංක 2197/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 3A පිටුවේ අංක 10 - 1123 යටතේ පළ කරන ලද ශුද්ධි පත්‍රයේ ඉඩම පිහිටි ග්‍රාම නිලධාරී වසම අංක 525-B උඩහමුල්ල බටහිර නොව අංක 527-C පතිරගොඩ ලෙස නිවැරදි විය යුතු බව ප්‍රකාශ කළද එය අංක 527-A පතිරගොඩ ලෙස නිවැරදි විය යුතු බව 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජල සම්පාදන අමාත්‍ය වාසුදේව නානායක්කාර වන මම මෙයින් ප්‍රකාශයට පත් කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/02/CO/84.

2021 අගෝස්තු මස 04 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

09-28

1A - G 34863 — 42 (2021/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, අළුත්ගම මතුගම හා අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ කොලේමෝදර තුළුමුව පිවිසුම් මාර්ගය පුළුල් කර ගැනීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/02/KT/68.

2021 අගෝස්තු මස 04 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

කළුතර දිස්ත්‍රික්කයේ, මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 815B, පහලගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පහලගොඩ ගමේ පිහිටි කොලේමෝදර ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 18 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

**කැබලි අංක - 01.**

*උතුරට* : කොලේමෝදර නව තුළුමුව ;
*නැගෙනහිරට* : කොලේමෝදර තුළුමුව පිවිසුම මාර්ගය ;
*දකුණට* : කලවැල්ලාව පාර ;
*බටහිරට* : යූ. එල්. ඒ. ඩී. සුනිල් ඇතුළුව අනෙකුත් ඉඩම් හිමියන්ගේ ඉඩම් කැබලි.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : සොයාගත නොහැක.

09 - 29

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.